**ගැටුම් වල බලපෑමට ලක්වූ ප්‍රදේශවල හදිසි අවශ්‍යතා ව්‍යාපෘතිය - "බී " සංරචකය -2013**

-----------------------------------------------------------------------------------------------

ගැටුම් වල බලපෑමට ලක්වූ ප්‍රදේශවල හදිසි අවශ්‍යතා ව්‍යාපෘතියේ - "බී " සංරචකය 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2010 ජුනි 07 දින එළඹි අංක 2626 - එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 (අ) වගන්තිය සහ 2011 අගෝස්තු 11 දින එළඹි අංක 0246-එස්ආර්අයි දරන ප්‍රදාන ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03(අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-------------------------------------------------------------------------------------

ගැටුවල බලපෑමට ලක්වූ ප්‍රදේශවල හදිසි අවශ්‍යතා ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, ලංකා විදුලි බල මණ්ඩලය (ලංවිම) මඟින් විදුලි බල හා බල ශක්ති අමාත්‍යාංශය, ජාතික ජල සම්පාදන හා ජලා පවහන මණ්ඩලය (ජාජසජම) මඟින් ජාතික ජල සම්පාදන හා ජලා පවහන අමාත්‍යාංශය සහ ව්‍යාපෘති සම්බන්ධීකරණ හා තත්ත්ව සහතික ඒකකය ( PCQAU ) ව්‍යාපෘතියේ "බී " සංරචකය සඳහා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. මූලික උපයෝගිතා ප්‍රතිස්ථාපනය කිරීම මඟින් ගැටුම්වල බලපෑමට ලක් වූ ප්‍රදේශවල ජීවනෝපාය, ආර්ථික යටිතල සහ පරිපාලන හා නීති සේවා ප්‍රතිස්ථාපනය හා වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, "බී " සංරචකය සඳහා යළි වෙන්කරන ලද මුළු පිරිවැය එජඩො මිලියන 29.49 ක් වූ අතර එයින් එ ජ ඩො මිලියන 26.29 ක් හෙවත් සියයට 89 ක් මූල්‍යායනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණි. ප්‍රදාන ගිවිසුම අනුව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය යටතේ සිවිල් වැඩ සඳහා එජඩො මිලියන 1.50 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් සපයනු ලැබේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 ජුනි 07 දින ආරම්භ කරන ලද අතර 2014 සැප්තැම්බර් 30 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

--------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

------------------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට

උපකාරි වන සාක්ෂි නියැදි පදනම මත පරික්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් සහ ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද, එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු කිරීම පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය දෙනු ලබන නියෝජිතායතනයෙන් ලැබුණු අරමුදල්වලින් ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද වියදම, මූල්‍ය සහ භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය හා ප්‍රදානවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය සහ ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය සහ ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව, වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව.

(උ) අග්‍රිම අරමුදල් ගිණුම් වලින් ආපසු ගැනීම් හා එම ගිණුම්වලට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව, හා 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ග ගෙන තිබුණේද යන බව.

(එ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණේද යන බව.

**3. මතය**

**------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුනු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී අග්‍රිම අරමුදල් ගිණුම්වලින් ආපසු ගැනීම් හා එම ගිණුම් වලට ඌනපූර්ණය කිරීම් , ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලවී තිබුණු බවත්ය.

## 4 මූල්‍ය ප්‍රකාශන

### 4.1 මූල්‍ය කාර්ය සාධනය

මූල්‍ය ප්‍රකාශන සහ ලබා ගත හැකි වූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.980,819,419 ක් හා ඉකුත් වර්ෂය සඳහා වියදම රු.1,119,279,544 වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.2,353,395,973 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| **විස්තරය** | **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම** | | **2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම** |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ - ජල සම්පාදන මණ්ඩලය - ණය | 323,106,845 | 233,427,326 | 633,185,625 |
| ජල සම්පාදන මණ්ඩලය - ප්‍රදාන | 24,103,981 | 178,185,515 | 202,289,496 |
| ලංවිම | 551,574,464 | 663,592,082 | 1,354,337,998 |
| උපකරණ - ජල සම්පාදන මණ්ඩලය - ණය | 26,154,860 | - | 26,154,860 |
| ජල සම්පාදන මණ්ඩලය - ප්‍රදාන | 14,743,423 | - | 14,743,423 |
| උපදේශක සේවා – ජල සම්පාදන මණ්ඩලය | 257,556 | 1,247,914 | 6,544,433 |

| | | | |
|---|---|---|---|
| වර්ධක මෙහෙයුම් පිරිවැය | | | |
| ජල සම්පාදන මණ්ඩලය | 13,587,503 | 13,258,635 | 31,260,574 |
| ව්‍යාපෘති සම්බන්ධිකරණ හා තත්ත්ව සහතික ඒකකය (PCQAU) | 14,447,766 | 16,138,361 | 43,793,833 |
| උපකරණ- (PCQAU) | 4,181,498 | 2,985,669 | 9,046,691 |
| වර්ධක මෙහෙයුම් පිරිවැය | | | |
| බැඳීම් ගාස්තු | 3,066,371 | 5,262,084 | 20,330,171 |
| පොලී | 5,595,152 | 5,181,958 | 11,708,870 |
| | --------------- | ---------------- | ----------------- |
| එකතුව | 980,819,419 | 1,119,279,544 | 2,353,395,973 |

## 4.2 අග්‍රිම අරමුදල් ගිණුම්

මුලා‍ය ප්‍රකාශන හා ලබාගත හැකිවූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළමු ජනනීය අග්‍රිම අරමුදල් ගිණුම්වල ( ණය සහ ප්‍රදාන ) මෙහෙයුම් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | ණය | | ප්‍රදාන | |
|---|---|---|---|---|
| | එජඩො | රු. | එජඩො | රු. |
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 495,699 | 63,033,528 | 21,133 | 2,687,290 |
| එකතු කළා : විදේශ විනිමය වාසිය | - | - | - | 7,205 |
| | ---------- | -------------- | ---------- | -------------- |
| අඩු කළා : ආපසු ගැනීම් | 495,699 | 63,033,528 | 21,133 | 2,694,495 |
| ව්‍යාපෘති සම්බන්ධිකරණ සහ තත්ත්ව සහතික ඒකකය (PCQAU) | 82,139 | 10,548,419 | 20,963 | 2,672,294 |
| - ජල සම්පාදන මණ්ඩලය | 407,567 | 51,674,588 | | |
| ආපසු ගෙවීම | - | - | 170 | 22,201 |
| විදේශ විනිමය පාඩුව | - | 26,846 | - | - |
| | ----------- | -------------- | ----------- | ------------ |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 5,993 | 783,675 | - | - |

## 5. විගණන නිරීක්ෂණ

### 5.1 මුලා‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කිරීම

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුලා‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 01 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණද, එහි සැලකිය යුතු ගිණුම්කරණ අඩුපාඩු හේතුවෙන් එම මුලා‍ය ප්‍රකාශන ප්‍රතික්ෂේප කරන ලදි. කෙසේ වුවද එකතුව රු.189,748,579 ක් වූ ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීමෙන් පසු සංශෝධිත මුලා‍ය ප්‍රකාශන නැවත ඉදිරිපත් කර තිබුණේ 2014 ජුනි 30 දිනදීය.

5.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) අවස්ථා දෙකකදී සාවද්‍යා මුදල් පරිවර්තන අනුපාත යොදා ගැනීම හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට ආසියානු සංවර්ධන බැංකු ණය මත විදේශ මුදල් හුවමාරු වාසිය රු.1,920,224 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2011 අගොස්තු 21 දින එළඹි සහ - මූල්‍ය ගිවිසුම යටතේ ජාත්‍යන්තර රතු කුරුස සම්මේලනය සහ රතු චන්ද්‍රවංක සංගම්වලට ( International Federation of Red Cross and Red Crescent Societies ) ලැබුණු රු.මිලියන 196.13 කට සමාන එජඩො මිලියන 1.5 ක් වූ ප්‍රදාන යටතේ යාපනය දිස්ත්‍රික්කයේ පොයින්ට් පේද්‍රුහි ජල සම්පාදන යෝජනා ක්‍රම සඳහා සිදුකරන කාර්යයන් පරිපාලනය කිරිමට ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණි. ප්‍රදානය 2013 සැප්තැම්බර් 30 දින වසා දමන ලද නමුත් රු.182,791,412 කට සමාන එජඩො 1,403,054 ක් උපයෝජනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) ජල සම්පාදන යෝජනා ක්‍රමවල කාර්මික, විදුලි හා අවශ්‍ය උපකරණ සම්පාදන කාර්යයන් සඳහා 2013 අගෝස්තු 31 දිනට නිමකළ වැඩ පිරිවැය රු.7,633,247 කට සමාන එජඩො 58,984 ක් ආපසු ගැනීම් ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය හේතුවෙන් ප්‍රතිපූර්ණය කළ නොහැකි වී තිබුණි. එකී ජල සම්පාදන යෝජනා ක්‍රම සම්බන්ධයෙන් රු.14,973,069 කට සමාන එජඩො 114,252 ක් සඳහා වෙනත් ආපසු ගැනීම් ඉල්ලුම් පත්‍ර තුනක් ජාත්‍යන්තර රතු කුරුස සම්මේලන ප්‍රදානයෙන් ප්‍රතිපූර්ණය කර ගනු වෙනුවට ආසියානු සංවර්ධන බැංකු ණයවලින් ප්‍රතිපූර්ණය කර ගෙන තිබුණි.

(ii) ජාතික ජල සම්පාදන හා ජලා පවහන මණ්ඩලය සඳහා උපකරණ මිලදී ගැනීමට ප්‍රදාන මුදල් යටතේ රු.12,499,892 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද උපකරණ මිලදී ගැනීම සඳහා රු.1,563,984 ක් වූ ශ්‍රී ලංකා රජයේ දායකය ප්‍රදාන යටතේ වෙනුවට ණය මුදල යටතේ සිදුකර තිබුණි. එබැවින් ණය යටතේ ප්‍රසම්පාදනය කරන ලද ජංගම නොවන වත්කම් වැඩියෙන් දක්වා තිබු අතර එම ප්‍රදාන එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

(iii) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ප්‍රදාන මුදල්වලින් සමාලෝචිත වර්ෂය තුළදී දරන ලද රු.30,243,783 ක් වූ වියදම, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික විසර්ජන ගිණුමෙහි දැක්වෙන රු.37,877,030 ක් වූ වියදම සමඟ එකඟ වී නොතිබුණි.

(iv) සමාලෝචිත වර්ෂය අවසානයට ජාතික ජල සම්පාදන හා ජලා පවහන මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සඳහා ගෙවිය යුතු රු.324,761 ක් වූ වර්ධක මෙහෙයුම් පිරිවැය ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස "බී" - සංරචකයේ වර්ධක මෙහෙයුම් පිරිවැය වටිනාකම එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

**5.3 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම**

**---------------------------------------------------**

මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව "බී" - සංරචකයේ ගනුදෙනු පිළිබඳ අභ්‍යන්තර විගණන කාර්යයන් සිදුකර නොතිබුණි.

## 6. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 6.1 අරමුදල් උපයෝජනය

අරමුදල් මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදන, සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන සමහරක් පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුම යටතේ මූල්‍යායනය කිරීම සඳහා එකඟ වූ මුදල | | 2013 වර්ෂය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවල කරන ලද වෙන්කිරීම් | සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කළ මුදල | | 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ මුදල | |
|---|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආසබැ - ණය | 26.29 | 3,437.42 | 922.0 | 0.49 | 906.18 | 15.88 | 2,064.44 |
| - ප්‍රදාන | 1.50 | 196.13 | 106.0 | 0.021 | 37.87 | 1.4 | 182.79 |
| ශ්‍රී ලං ර | 3.38 | 442.59 | 45.5 | - | 36.77 | - | 106.16 |
| එකතුව | 31.17 | 4,076.14 | 1,073.5 | 0.511 | 980.82 | 17.28 | 2,353.39 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බලය නොලත් ගනුදෙනු හා දෙවරක් හිමිකම් පෑම වැනි විවිධ හේතූන් මත රු.2,558,166 කට සමාන එජඩො 20,140.61 ක් වටිනා ප්‍රතිපූර්ණ ඉල්ලුම්පත් සමාලෝචිත වර්ෂය තුළදී රඳවා ගෙන තිබුණි.

(ආ) රු.මිලියන 3,855.79 ක් වූ ණය හා රු.මිලියන 220.35 ක් වූ ප්‍රදාන වෙන්කිරීමෙන් සියයට 55.4 ක් හා සියයට 98.49 ක් නියෝජනය වූ පිළිවෙලින් රු.මිලියන 2,136.36 ක් වූ ණය මුදල් හා රු.මිලියන 217.03 ක් වූ ප්‍රදාන මුදල් 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණි. තවද ණය හා ප්‍රදාන මුදල් උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විස්තරය | ඇස්තමේන්තුගත වියදම (යළි වෙන්කරන ලද) | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම | මුළු ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සමුච්චිත වියදම |
|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| ආයෝජන පිරිවැය | | | | |
| සිවිල් වැඩ – ලංවිම | 15.47 | 2,022.70 | 1,354.34 | 66.96 |
| - ජා ජ ස ජ ම | 9.66 | 1,263.04 | 633.19 | 50.13 |
| උපකරණ | 2.34 | 305.95 | 26.15 | 8.55 |
| උපදේශක සේවා -සැලැසුම් කිරීම හා අධීක්ෂණය | 0.08 | 10.46 | 6.54 | 62.52 |

| | | | | |
|---|---|---|---|---|
| පුනරාවර්තන පිරිවැය | | | | |
| වර්ධක - ජා ජ ස ජ ම | 0.45 | 58.83 | 31.26 | 53.13 |
| ව්‍යාපෘති කළමනාකරණය - PCQAU | 1.12 | 146.44 | 52.84 | 36.08 |
| පොලී සහ බැඳීම් ගාස්තු | 0.37 | 48.38 | 32.04 | 66.23 |
| උප එකතුව | 29.49 | 3,855.80 | 2,136.36 | 55.40 |
| සිවිල් වැඩ සහ උපකරණ - ප්‍රදාන | 1.68 | 220.35 | 217.03 | 98.49 |
| මුළු එකතුව | 31.17 | 4,076.14 | 2,353.39 | 57.73 |

මේ සම්බන්ධයෙන් තවදුරටත් පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) ව්‍යාපෘතියේ 'බී' සංරචකය 2014 සැප්තැම්බර් 30 වන විට නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කාල පරිච්ඡේදයෙන් සියයට 80 කට වැඩි ප්‍රමාණයක් ඉක්මවා තිබීමෙන් පසුවද අනුමත ණය මුදලින් සියයට 55.4 ක් පමණක් "බී" සංරචකය විසින් උපයෝජනය කර තිබුණි.

(ii) ලංකා විදුලි බල මණ්ඩලයේ හා ජාතික ජල සම්පාදන හා ජලා පවහන මණ්ඩලයේ සිවිල් වැඩ සඳහා රු.මිලියන 3,285.74 ක මුදලක් වෙන්කර තිබුණද, රු.මිලියන 1,987.53 ක් හෙවත් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 60.48 ක් පමණක් අරමුණු කළ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණි. කෙසේ වුවද , ව්‍යාපෘති පරිපාලන අත්පොතේ සමස්ත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්මේ 'බී' වගුවේ 12 ඡේදය ප්‍රකාරව, සියළුම බල ශක්ති හා ජල සැපයුම් කාර්යයන් 2013 මාර්තු අවසානය වන විට නිම කළ යුතුය.